# සිඩ්නි නුවර අවුරුදු සැනකෙළිය

බක් මාසයේ උදාවත් සමග සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සම්ප්‍රාප්ත වීමේ සුභ පෙර නිමිති පහල වන විට අපගේ මව් බිම පුරා නැගී එන පිබිදීම කොතරම් මනස්කාන්තද ? ඒ පිබිදීම පරිසරය පුරා පැතිර ගොස් දන මන පුබුදුවා හද සන්තානයන්හි උපදවන ප්‍රමෝදය සතුටු ගඟුලක් බවට පත් වී දෙගොඩ තලා ගලා යන්නේ, අවසන සිංහල දෙමළ අලුත් අවුරුද්ද දොරට වැඩීමෙනි. එරබදු ගස් වල මල් පිපී, ගස් රතු පාට මලින් සැරසෙන විට කජු, අඹ, දඹ , රඹ, නාරන් හා පනා ආදී තුරු ලතාවෝ ද මලින්, පලින් බරවී කෙත් වතු ද සශ්‍රීක වී ගම මෙන්ම සිදාදිය ද අවුරුද්ද සැමරීමට පෙළගැසෙයි. කැවුම්, කොකිස්, මුං, අතිරස තෙලේ බැදෙන විට ගෙයි මුල්ලේ ඉදෙන කෙසෙල් කැන් වල සුවඳ ද ඊට මුසුව නිවෙස්නයන් අවුරුදු සුවඳින් පුරවාලයි. රාත්‍රී යාමයේ නැගෙන රැහි හඬට මුසුවී ඈතින් ඇසෙන රතිඤ්ඤා හඬ ළඟ ළඟ අවුරුදු එන බවට ඉඟි කරයි.

අප සිත් අවුරුදු උළෙල වෙතටම තව තවත් පොලඹවාලමින්, කඩසාප්පු පමණක් නොව පදික වේදිකාද අවුරුදු සැනකෙළියට සැරසෙයි. අස්වනු නෙලා අටු කොටු හා අතමිටද සරුවන මෙකල තෑගි බෝග හා අලුත් ඇඳුම් ගෙට ගොඩවන්නේ සතුටු හැඟුම් ද පිරිවරා ගනිමිනි. පරණ තරහ මරහ හිත්වලින් දුරස් කර නෑගම් යෑම්ද මෙකල සිදු වේ. ගෙවල් දොරවල් පිළිසකර කිරීම් හා පිරිසිදු කිරීම් නිසා වෙනදා නැති කඩිසර බවක් පරිසරයේ මතුවෙයි. අවුරුදු දාට එළඹෙන නොනගතය, පුන්‍ය කාලය , නැකතට වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම, වැඩිහිටියන් නැමදීම, රස අහරින් ප්‍රීනනයවීම, ඔන්චිලි වාරම්, රබන් හඬ, අවුරුදු උළෙල පැවැත්වීම් ආදී මේ ක්‍රීඩා හා සිරිත් විරිත් වලින් සපිරුන අවුරුදු සිරිය රට පුරා ඉතිරී පැතිරී ගොස් රටම මහා මංගල්‍යයක් බවට පත්කරයි.

සිඩ්නි නුවර පදංචියට පැමිණි මුල් කාලයේ බක් මාසය ලංවන විට සිත අවුරුදු ගැනම සිහින මවයි. එවිට එහි බක් මහට සිදුවන අසිරිමත් සිදුවීම් පෙළ චිත්‍රයක් ලෙසින් සිත පුරා ඇඳී යයි. ඉන් තුටු පහටු වන මසිත සැනකින් තෝන්තුවීයන්නේ නොරටක කුමන අවුරුදු දැයි සිතෙන විටය. දුරු රට තනිව සිටින ඔබ ද සමහර විට මා ලැබූ මේ අත් දැකීම ලැබ ඇතිවාට සැක නැත.

ගෙයින් ගෙට සතුට, සාමය හා සහජීවනයේ පණිවිඩය රැගෙන මවු බිම පුරා පැතිරී යන බක් මහේ මේ සැනකෙළි අවසන් වනුයේ වෙසක් මස තෙමඟුල සමරනුවස් පවත්වනු ලබන ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ගෙන් හෙලයාගේ සිත, මෙත් සිසිලෙන් ද දොවා හැරීමෙන් පසුවය.

සිංහල අවුරුදු උළෙල සැමරීම අපගේ ජීවිතයට ලැබදෙන අත්දැකීම් සමුදාය කොතරම් දැයි කිවහොත් සිංහලයා මේ යැයි වෙන්කොට හඳුනා ගැනීමට තරම් ප්‍රතිරූපයක් ඉන් ගොඩ නැගෙයි. සිංහල අලුත් අවුරුද්ද යනු බොදු දහමින් පෝෂනය වුනු හෙළයාට ගසට පොත්ත සේ බද්ධ වූවකි. එය කළගුන සැලකීම, වැඩිහිටියන්ට ගරු කිරීම, සමගිය සමාදානය වැනි මාහැඟි ගුන සමුදායකික් පෝෂනය වී, වර්ධනය වී, සංරක්‍ෂනය වී පවත්වා ගෙන යනු ලබන සිරිත් විරිත් හා ක්‍රීඩාවන්ගෙන් පිරිපුන් ශ්‍රී ලාංක-කයාගේ ජාතික උත්සවයයි. වසරක් පාසා සිරිලක් වාසීන් විසින් පවත්වා අත් විඳින මේ සිරිත් විරිත් සමුදාය විසින් අපි අපේම අනන්‍යතාවයක් උරුම කරගත් පරිපූර්ණ පිරිසක් බවට පත් කිරීමටත්, එවැනි පුද්ගලයින් ගෙන් සපිරුන සමාජයක් ලෙසත් ගොඩනැගීමට මංපෙත් පාදයි.

එවන් මාහැඟි මංගල්‍යයක නිත්‍ය කොටස් කරුවන් වීමට එයට සහභාගි වී, එහි උතුම් සිරිත් විරිත් වලින් අප චරිත ගොඩනගා ගැනීමට නොරටක වසන අපත් අපගේ දරුවනුත් තවදුරටත් භාග්‍යවන්තයෝ නොවමු. ජීවිතය හා සැබැඳී පවතින සිංහල අලුත් අවුරුද්දෙන් අප ලබාගත් ඒ ආභාෂය අපේ දුවා දරුවන්ට එලෙසින්ම ලබා ගැනීමට හෝ ලබා දීමට විදේශයක සිටින අපට වසර විසිපහකට පමණ පෙර දී ක්‍රමයක් තිබුණේ නැත. ඊට පැන නැගුනු සීමා මායිම් එමටය. වසරකට වරක් දුවා දරුවන් එක් කරගෙන නෑසියන් ද දැක බලාගෙන සිය රට යෑමත් එහිගොස් අලුත් අවුරුද්ද සැමරීම නොකඩවා කිරීමත් උගහටය. එය හැමදා-ාමත් හැමෝටමත් කිරීමට නොපුලුවන. මන්ද එයට ආර්ථික හෝ පෞද්ගලික හේතූන් බාධක වන හෙයිනි.

විවිධ හේතු මත මෙරටට සංක්‍රමනය වුවත් තමාගේ සිරිත් විරිත් තම දරුවන්ට ලබා දීමේ අගය දත් සමහර දෙමාපියන් ඊට විකල්පයක් ලෙසින් අවුරුදු දිනයේ නිවාඩු දමා හෝ දරුවන්ට අවුරුදු සිරිත් විරිත් ගෙදර දී පෙන්වා දීමට යම් කිසි උත්සාහයක් ගන්නා හැටි මා මෙන්ම ඔබද දැක ඇතිවාට සැක නැත. නමුත් එය කෙතරම් ඵලදායී වූවාදැයි නොදනිමි.

කාලය මෙලෙසින් ගෙවී යද්දී සිඩ්නි නුවර ශ්‍රී ලාංකිකයින් විසින් පවත්වාගෙන යනු ලබන සංවිධානයක් මීට වසර ගණනාවකට ඉහතදී සිංහල අලුත් අවුරුදු උළෙලක් පැවැත්වීය. ශ්‍රී ලංකා සංගමය නමින් හැඳින් වූ මේ සංවිධානය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ඇතුළු ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පිරිසක් විසින් සිඩ්නි හි පවත්වාගෙන යනු ලබන සංවිධානයකි. වුන් එදා අවුරුදු උළෙලක් පවත් වන්නට අත් පොත් තැබීම සැමගේ අමන්දානන්ද-යට හේතු වූවාට සැක නැත. ඒ බව සනාථ කරමින් ඉන් ටික කලකට පසුව මෙහි බිහි වූ සිංහල සංස්කෘතික හමුව යථෝක්ත සංවිධානය හා එකට එකතු වී සිංහල අලුත් අවුරුදු උළෙල වඩාත් විචිත්‍රවත්ව සිඩ්නි නුවර සංවිධානය කිරීමට ආරම්භ කළ අතර, අද වන විට වසරක් පාසා සමගියෙන් අත්වැල් බැඳගෙන අවුරුදු උළෙල සැමරීමට තවත් සංවිධාන කීපයක්ද මේ වටා ඒක රාශීවී



සිටියි. මේ එක්වීම හැම අතින්ම පලදායී වෙයි. සමගිය මූර්තිමත් කිරීම මා මෙහි දකින සුවිශේෂී වැදගත් කමයි. සිඩ්නි නුවර පවත්වාගෙන යනු ලබන සංවිධාන යම් යම් අරමුණු පෙරදැරි කරගෙන සංවිධානය වී ඇතත් අවුරුදු උත්සවයේ දී එක අරමුණක් කරා යොමු වීම තුලින් එක රටකින් ආ අපගේ උදාර මිනිස් හැඟීම් පෙන්වා දෙමින් සමගියෙන් අවුරුදු කාලයේ ක්‍රියා කිරීම අපේ අනාගත පරපුරට ආදර්ශයක් සපයන අතර මහා ජන ගඟක් එක වහලක් යටට එකතු වී සිංහල අවුරුදු සැමරීම ඉඳහිට දැක ගැනීමේ වන දුර්ලභ අවස්ථාවක් ද උත්පාදනය කරයි. කාලය, ශ්‍රමය, ධනය මැනවින් කළමනාකරණය වී කුඩා කණ්ඩායම් එක්වීමෙන් ලබාගත නොහැකි බලයක් හා ආලෝකයක් මේ එක් වීම තුලින් ගොඩනැගෙයි. එය හොඳ ආදර්ශයකි. පිල්නොබෙදී සහජීවනය අර්ථවත් කරන මෙවන් සමාජ සේවාවන් හැමට සෙත සලසයි.

ඒ යහපත් මග තව දුරටත් යමින් මෙම වසරේ ද 2011 බක්මහ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උළෙල සිංහල සංස්කෘතික හමුව, ශ්‍රී ලංකා ජර්මානු අභ්‍යාස විද්‍යාලයීය ආදි සිසුන්ගේ සංගමය, ස්පර් සංවිධානය, ස්කැටිස් සංවිධානය, ෆීල් ෆෝ ලයිෆ් සංවිධානය හා ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයීය ආදි සිසුන්ගේ සංගමය යන සංවිධානයන්ගේ සහභාගිත්වයෙන් මහ ඉහළින් පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී. 2011 අප්‍රේල් 10 වන දින සිඩ්නි නුවර කාර්ලින්ෆර්ඩ් හි රෝස්ලි ප්‍රජා ශාලාවේදී දවස පුරා අලුත් අවුරුදු උළෙල පැවැත්වෙනු ඇත.

එදින පෙරවරු 8.30 ට සුභ මොහෙතින් චිරාගත සම්ප්‍රදානු කූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව බක්මහ උළෙල ආරම්භ වන අතර පැමිණ සිටින සියලුම දෙනාට සිංහල අවුරුදු කැවිලි පෙවිලි කිරිබත් සහිත සංග්‍රහයක් පැවැත්වෙනු ඇත. වැඩිහිටියන් නැමදීම, බුලත් හුරුළු පිළිගැන්වීම ඇතුලු අවුරුදු සිරිත් පැවැත්වීමෙන් අනතුරුව රෝස්ලි ප්‍රජාශාලා ක්‍රීඩාංගනයේදී කඹ ඇදීම, චග්ගුඩු ගැසීම, ගෝනියේ බැස දිවී ම වැනි එළිමහනේ කෙරෙන ක්‍රීඩාවන් ද චිත්‍ර තරඟ, සංගීත පුටු තරඟ, ගායනා තරඟ වැනි ගෘහස්ථ ක්‍රීඩා තරඟද පැවැත්වෙනු ඇත. මෙවර උළෙලේ විශේෂත්වයක් වන්නේ අපේ ළමා හා තරුණ පරපුර දවසේ වැඩසටහනට වැඩිපුර සහභාගි කරවා ගැනීමට අවධානය යොමු කිරීමයි. උළෙල සංවිධානය කිරීමේ මූලිකත්වය ගෙන ක්‍රියාකරන සංවිධාන විසින් දවස පුරා විවිධ ආහ-ාරයන්ගෙන් සමන්විත ආහාර වෙළඳ කුටි පැවැත්වීමට ද කටයුතු යොදා ඇත. මෙදින හවස් වරුවේ පැවැත්වෙන විකට ඇඳුම් තරඟය, අවුරුදු කුමර කුමරියන් තේරීම සහ සංස්කෘතික සංදර්ශනය යන අංග මගින් සිංහල අළුත් අවුරුදු උළෙල තව තවත් ඔපවත් වනු ඇත.

පසුගිය වසරේ සිංහල අලුත් අවුරුදු උත්සවයට දවස පුරා දෙදහ-සකට අධික පිරිසක් සහභාගි වූ අතර මෙවර ඊට වැඩි පිරිසක් පැමිණෙනු ඇතැයි සංවිධායකයෝ අපේක්‍ෂා කරති.

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද නම් වූ අපගේ පාරම්පරික උරුමය රැක ගැනීමට, එහි අංශුමාත්‍රයක් හෝ අප හට, අපේ දරුවනට අත්විඳීමට අවස්ථාවක් උදා කර දීමට මේ සංවිධාන යන්නා උත්සාහය පැසසිය යුතුය. සිරිලක් සුවඳ බිඳක් අප වෙත ගෙනවිත් අවුරුදු සිරිය මේ යයි පෙන්වන්නට දරුවන්ට එය මොහොතක් විඳ සැනසෙන්නට අවස්ථාවක් උදාකර දෙන්නට මේ සංවිධාන වසර ගණනාවක් තිස්සේ කටයුතු කරගෙන යන බව පෙනේ. මෙරටට ගැලපෙන අයුරින් සිංහල අවුරුදු උළෙල වසර ගනනාවක් පුරා පවත්වාගෙන යමින් සිඩ්නි නුවර වසන අපටත් අවුරදු සිරිය හා එහි හරය බිඳක් හෝ ලබාදී අපගේ අනාගත පරපුරටද එය දායාද ලෙසින් පිරිනැමීමට මේ සංවිධානයන් දරන අප්‍රතිහත ධෛර්යය අප ඉහලින්ම අගය කළ යුතුය. ඒ සංවිධාන හැමටම අපේ ස්තුතිය පුද කරන අතර ලෝකය පුරා විසිරී සිංහල අලුත් අවුරුද්ද සමරන සෑම දෙනාටම උදාවන්නාවූ 2011 සිංහල අවුරුද්ද සෞභාග්‍යමත් එකක්ම වේවායි ඉත සිතින් පතමු.




රැහැයියන් නිදි වැදුන
මැදියමේ සඳ සරැලි
ගලා ගිය සයුරු තෙර
පා නගා නිහරැවම
පැමිණි ඔහු නිසසලව
ඈඳිගෙන මා පසෙක
වයන්නට විය
සුරත රැඳි
වීණාව

නිනඳ විය
ස්වප්නය
උන්මාදනීය නිද්‍රාව
අතුල මා
දෑස් මත

ශාපලත් නිද්‍රාව
සොරාගති
මා පැතුම
දසුන
ඔහු වත

රාත්‍රීන්
එකින් එක
එකින් එක
ගෙවී යයි

බිඳී
සසැලෙන
ආත්මය
ඉකි ගසයි
දුර්භාග්‍යයේ
වේදනාවෙන්

සදා
අහිමිද ඒ
හමුවීමේ
චමත්කාරය ...?

සුසුමක
සුවඳ රැඳි
ස්වප්නයක්ම මිස ...

He came and sat by my side but I woke not.
What a cursed sleep it was, O miserable me!

He came when the night was still; he had his
harp in his hands, and my dreams became
resonant with its melodies.

Alas, why are my nights all thus lost? Ah,
why do I ever miss his sight whose breath
touches my sleep?
. .

*රබින්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු